www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාව: ටාටා මෝටර්ස් සමාගම බටහිර බෙංගාලයෙන් ඉවත් වන බව නිවේදනය කරයි

## India: Tata Motors announces pullout from West Bengal

**අජේ ප්‍රකාශ් සහ කීත් ජෝන්ස් විසිනි**
**2008 ඔක්තෝබර් 11**

බටහිර බෙංගාල ප්‍රාන්ත ආන්ඩුවේ ඉඩම් පවරා ගැනීමේ වැඩපිලිවෙලට එරෙහිව අඛන්ඩව නැගෙන මහජන විරෝධය ගැන කෝපයට පත්ව ඇති ටාටා මෝටර්ස් සමාගම, බටහිර බෙංගාලයේ සින්ගූර්හි ඉදිකිරීමේ වැඩ අවසන් කිරීමට ආසන්නව ඇති ඩොලර් මිලියන 350ක කම්හලෙන් සිය නැනෝ මෝටර් රථ ව්‍යාපෘතිය ඉවත් කර ගෙන තිබේ.

එ.ජ. ඩොලර් 2500කට අඩු මිලකට අලෙවි කෙරෙනු ඇතැයි කියනු ලබන නැනෝ, එනම්, "මහජනයාගේ මෝටර් රථය", නිෂ්පාදනය කිරීම, මේ මස අවසානය වන විට සින්ගූර් පිරිද්දුම් කම්හලේ දී ආරම්භ කිරීමට නියමිතව තිබුනි. ඒ වෙනුවට, සමාගම මෙම ඉහල පෙලේ ව්‍යාපෘතිය බටහිර ඉන්දියාවේ ගුජරාට් ප්‍රාන්තයට මාරු කර තිබේ. එහි බලයේ සිටින හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) ආන්ඩුව, බටහිර බෙංගාලයේ ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඑම්) නායකත්වයෙන් යුක්ත වාම පෙරමුනු ආන්ඩුව මෙන් ටාටා සමාගමේ ඉල්ලීම් ඉටු කිරීමට අඩු ගනනේ ප්‍රතිඥා දී තිබේ.

සමාගම බටහිර බෙංගාලයෙන් ඉවත් වන බව නිවේදනය කරමින්, ටාටා මෝටර්ස් සභාපති රටන් ටාටා, ස්ටැලින්වාදී ප්‍රාන්ත ආන්ඩුවට ඉහලින් ම ප්‍රශංසා කලේ, සින්ගූර්වලින් ඉවත් වීමේ සිය සමාගමේ තීන්දුව සම්බන්ධයෙන් සම්පූර්න වගකීම ම ත්‍රිනමූල් (බිම් මට්ටමේ) කොංග්‍රසය මත පවරමිනි. දක්ෂිනාංශික, බටහිර බෙංගාල ප්‍රාදේශීය පක්ෂයක් වන ත්‍රිනමූල් කොංග්‍රසය (ටීඑම්සී), සින්ගූර්හි ගොවි ජනයා සිය ඉඩම් අල්ලා ගැනීමට එරෙහිව ගෙන යන උද්ඝෝෂනයේ නායකත්වයට රිංගා ගැනීමට සමත් විය.

ටාටා සමාගම සින්ගූර් භූමියට වහ වැටුනේ කොල්කතා නගරයට එහි ඇති සමීප පිහිටීම හා මහා මාර්ග සම්බන්ධතා නිසා ය. එවිට, බටහිර බෙංගාල ආන්ඩුව, අක්කර 1000ක ප්‍රධාන කෘෂිකාර්මික ඉඩම්වලින් සින්ගූර් ගොවීන් 13,000ක් පලවා හරිනු පිනිස විජිත පාලන කාලයේ ඉඩම පවරා ගැනීමේ නීතියක් සහ රාජ්‍ය මර්දනය යොදා ගනිමින්, සිය යුතුකම ඉෂ්ට කලේ ය.

ගොවීන්ට ගෙවන වන්දි ඉහල දැමීමටත් පවරා ගත් ඉඩම්වලින් කොටසක් ආපසු දීමටත් ප්‍රාන්ත ආන්ඩුව එකඟ වීමෙන් පසුව, සැප්තැම්බර් 7 දා, ත්‍රිනමූල් කොංග්‍රසය සින්ගූර්හි සති දෙකක් තිස්සේ පැවති උද්ඝෝෂනය අත්හිටුවී ය. එහෙත්, ඒ පිලිබඳව තමන්ගේ අදහස් විමසීමක් නොකල බවට පැමිනිලි කල ටාටා සමාගමේ පීඩනය යටතේ, ටීඑම්සී සහ වාම පෙරමුනු ආන්ඩුව අතර ඇති කර ගැනුනු එකඟතාව ඉක්මනින් ම බිඳවැටුනි.

තමන්ට තව දුරටත් ප්‍රමාද වීම් ඉවසිය නොහැකි බව පවසමින් ද තමන් සේවකයන්ගේ ආරක්ෂාව ගැන උත්සුක වන බව කියාපාමින් ද ටාටා මෝටර්ස් සමාගම, ඉඩම් පවරා ගැනීම පිලිබඳ මතභේදය ඉක්මනින් ම විසඳුනේ නැති නම් බටහිර බෙංගාලයෙන් නැනෝ ව්‍යාපෘතිය ඉවත් කර ගන්නා බවට කල සිය තර්ජනය, ඔක්තෝබර් 3 දා, සම්පූර්න කලේ ය.

රටන් ටාටා මෙසේ පැවසී යඃ "මෙම තීන්දුව, . . . ගෙන ඇත්තේ අතිමහත් ශෝකයකින්. ඒ මක් නිසා ද කිව්වොත්, මීට වසර දෙකකට පෙර අපි මෙහි ආවේ වත්මන් ආන්ඩුවේ ආයෝජක-හිතැති පිලිවෙත කෙරෙහි ආකර්ෂනය වෙලා නිසා. . . . අපිට තවමත් (බටහිර බෙංගාලයේ මහ ඇමති සහ ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මන්ඩල සභික) බුද්ධාඩෙබ් භට්ටාචාර්ජීගේ නායකත්වය ගැන විශාල ගෞරවයක් තියෙනවා. . . . ආන්ඩුව අපට දීපු සහයෝගය අපි ඉතා අගය කරනවා. අවාසනාවකට විපාර්ශ්වික පක්ෂවලින් කොටසක් ගෙන යන දැවැන්ත උද්ඝෝෂනවලට හා ආක්‍රමනවලට මුහුන දෙන්නත් අපට සිදු වුනා. ඇත්ත වසයෙන් ම, මෙම තීන්දුව ගැනීමට අපට එක ම හේතුව වුනේ ඒකයි."

සිය සමාගම බටහිර බෙංගාලය හැර යන්නේ යහපත තකා නොවන බව පැවසීමෙන් පසුව, ටාටා යලිත් වාම පෙරමුනු ආන්ඩුව කෙරෙහි සිය සමාගමේ ප්‍රශංසාව ප්‍රකාශයට පත් කලේ ය. "බටහිර බෙංගාලය සංවර්ධනය කරන්න මහ ඇමතිතුමා ගෙන යන උත්සාහය ගැන අපි ඇත්තටම විශ්වාස කරනවා, ඒකට ගරු කරනවා. ඒ විශ්වාසය නම් අඩු වෙලා නැහැ."

ටාටා තව දුරටත් මෙසේ පැවසී යː " මට යලිත් පැවසීමට අවශ්‍ය යි. . . . අපි බටහිර බෙංගාලය හැර යාමට හේතුව (ත්‍රිනමූල් කොංග්‍රසයේ නායක) මමතා බැනර්ජි මෙනෙවියගේ නායකත්වයෙන් විපාර්ශ්වික පක්ෂ ගෙන යන උද්ඝෝෂනය යි, අන් කිසිම හේතුවක් නෙවි."

ඉන්දියාවේ වානිජ හා කර්මාන්ත මන්ඩල සමූහය (ඇසොචැම්) ද බටහිර බෙංගාලයට නැනෝ ව්‍යාපෘතිය අහිමි වීම ගැන විපාර්ශ්වික පක්ෂවලට දොස් නැගූ අතර, ටාටා සමාගම මෙන් ම, ස්ටැලින්වාදීන්ගේ ඉඩම් පවරා ගැනීමේ පිලිවෙත ගැන කිසිදු විවේචනයක් නොකලේ ය. "දෝෂාරෝපනය එල්ල වන්නේ දේශපාලන සංස්ථාවේ කොටසකට ය. ඒ සම්බන්ධයෙන් බරපතල වන්දියක් ගෙවීමට මහජනතාවට සිදු වෙනවා ඇත." යයි ඇසෝචැම් මහ ලේකම් ඩී.එස් රවාට් පැවසී ය.

ටාටා සමාගමේ තීන්දුව ස්ටැලින්වාදී ප්‍රාන්ත ආන්ඩුවේ "කාර්මිකකරන" පිලිවෙතට එල්ල වූ බරපතල පහරකි. ඉන්දියානු ධනේශ්වරයේ "ප්‍රතිසංස්කරන" වැඩපිලිවෙලේ තථ්‍ය සමාන කාබන් පිටපතක් වන එම පිලිවෙත සමන්විත වන්නේ, බටහිර බෙංගාලය තුල වැඩපොලවල් ඉදි කොට ප්‍රාන්තයේ බහුලව පවතින ලාභ ශ්‍රම සැපයුම පාවිච්චි කරනු පිනිස ඉන්දියානු සහ විදේශ ප්‍රාග්ධනය පොලඹවා ගනු වස් සමාජ වියදම් කප්පාදු කිරීම, "රෝගී" රාජ්‍ය අංශයේ ව්‍යවසායන් පුද්ගලීකරනය, ආයෝජකයන්ට දැවැන්ත බදු හා ඉඩම් සහන ප්‍රදානය කිරීම සහ කම්කරු පන්තියේ විරුද්ධත්වය මැඩීමට නීති රීති හා ස්ටැලින්වාදී-පාලිත වෘත්තීය සමිති උපකරන යොදා ගැනීම ආදියෙනි.

සමාජවාදය "ඈත අනාගතයේ ඉල්ලීමක්" ලෙස පසෙකට දමා ඇති, භට්ටාචාර්ජි සහ ඉන්දියාවේ (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂය, බටහිර බෙංගාලය සංවර්ධනය කිරීමේ එකම මාවත "ධනවාදය ගොඩනැගීම" යයි තර්ක කර තිබේ. ඉඩම් තමන්ගේ එකම ජීවනෝපාය වන ගොවීන්ගෙන් ඉඩම් අල්ලා ගන්නා ඔවුහු ඒවා විශේෂ ආර්ථික කලාප සඳහා ලබා දෙති. මෙසේ කරනු ලබන්නේ වගා කල හැකි ඉඩම්වල තියුනු හිඟයක් පවතින ප්‍රාන්තයක් තුල ය.

සින්ගූර් ගොවීන් සිය ඉඩම්වලින් පලවා හරිනු පිනිස ආන්ඩුව නීතිරීති හා පොලීසිය යොදා ගැනීමෙන් පසුව පවා, 2,000ක පමන සංඛ්‍යාවක් ආන්ඩුවේ වන්දි වැඩපිලිවෙලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කලහ. ඉන්දුනීසියාවේ පාදක සලිම් සමූහ ව්‍යාපාරයට නන්දිග්‍රාම්හි විශාල ඉඩම් ප්‍රමානයක් භාර දීමට එරෙහි විරුද්ධත්වය මඩිනු පිනිස, 2007 වසරේ දෙවතාවක් ම, ස්ටැලින්වාදියෝ මාරාන්තික බලවේග යොදා ගත්හ.

ටාටා ඉවත්ව යාමෙන් ඉක්බිතිව ද, ස්ටැලින්වාදීන් අවධාරනය කර ඇත්තේ තමන් සිය ආයෝජක-හිතැති වැඩපිලිවෙල උත්සන්න කරනු ඇති බවට යි. බටහිර බෙංගාලයේ කර්මාන්ත ඇමති නිරුපම් සෙන් වාර්තාකරුවන්ට මෙසේ පැවසී යː "නැනෝ ව්‍යාපෘතිය ඉවත්ව යාමත් එක්ක බටහිර බෙංගාලයේ අට කෝටියක් ජනයාට පාඩු වෙලා තියෙනවා. ඒ පාඩුව පිරිමහ ගන්නෙ කොහොමද කියන එක අපි දන්නෙ නැහැ." ඔහු ඉන් පසුව මෙසේ එකතු කිරීමට ද ඉක්මන් වියː "ප්‍රාන්ත ආන්ඩුව කාර්මිකකරනයට දිගට ම කැප වෙනවා. "

ටාටා මෝටර්ස් සමාගම අතහැර දැමූ අක්කර 1,000ක ඉඩම් සින්ගූර් ගොවීන්ට ආපසු දීමේ ඉඩකඩ සෙන් බැහැර කලේ ය. "ඒ ඉඩම් අයිති ආන්ඩුවට. මොනවද කරන්නේ කියන එක අපි පස්සේ තීන්දු කරනවා. ඒක වෙනත් කර්මාන්තයකට යොදා ගනීවි." යයි සෙන් පැවසී ය.

## සින්ගූර් ගොවීන්ට ඉඩම් වත් රැකියා වත් නැත

එනයින් ගත් කල සින්ගූර් ගොවීහු මුලුමනින් ම අතරමං කරනු ලැබ ඇත. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් සිය කම්හලටත් සින්ගූර්හි වැඩපොලවල් ගොඩනගමින් සිටි උපකාරක මෝටර් රථ කොටස් තනන සමාගම්වලටත් බඳවා ගනු ඇතැයි ටාටා සමාගම පවසා තිබුනි. දැන් සමස්ත ව්‍යාපෘතිය ම අතහැර දමා ඇත්තේ ඔවුන්ට ඉඩම් හෝ රැකියා අහිමි කරමිනි.

සින්ගූර් කම්හලට මේ වන විටත් බඳවා ගෙන ඇති අයට සෙසු කම්හල්වල රැකියා ලබා දීමට තමන් උත්සාහ කරන බව ටාටා සමාගම පැවසුවේ ය. එමෙත් මෙම පොරොන්දුව ඉටු කරනු ලැබුවා වුවත්, එයින් අදහස් කෙරෙන්නේ කම්කරුවන්ට හා ඔවුන්ගේ පවුල්වලට බටහිර බෙංගාලය හැර යාමට සිදු වන බව යි.

ගොවියකු මෙසේ පවසනු *ටෙලිග්‍රාෆ්ඉන්දියා* වෙබ් අඩවිය උපුටා දැක්වී යː "අපි හොඳටම ව්‍යාකූල වෙලා. ආන්ඩුකාර බංගලාවෙදි මමතා බැනර්ජිත් ප්‍රාන්ත ආන්ඩුවත් අතර ගිවිසුමක් ගහ ගත්තා. ඒත් බුද්ධාඩෙබ් භට්ටාචාර්ජිගේ ආන්ඩුව ඒ අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කලා. ඉතිං ඒ වගේ ආන්ඩුවකින් අපි මොනවා බලාපොරොත්තු වෙන්නද? ටාටාලා යනවා. ඒත් මට විශ්වාස නැහැ අපිට කොහොමද අපේ ඉඩම් ආපහු ලැබෙන්නෙ කියලා."

සින්ගූර්හි සිද්ධීන්ගෙන් වාසි ලබන එකම පිරිස මමතා බැනර්ජි සහ ඇගේ දක්ෂිනාංශික ත්‍රිනමූල් කොංග්‍රසය යි.

බැනර්ජි අන්ත දක්ෂිනාංශික බීජෙපීයේ දිගු කාලීන හවුල්කාරියක වන අතර, ඉන්දියානු ධනේශ්වරයේ නව ලිබරල් ප්‍රතිසංස්කරන න්‍යාය පත්‍රය ක්‍රියාවට දමා ඇති කොංග්‍රස් පක්ෂයේ ද බීජේපීයේ ද නායකත්වයෙන් යුක්ත ජාතික ආන්ඩුවල කැබිනට් ඇමතිවරියක ලෙස නැවත නැවතත් සේවය කර තිබේ. එහෙත් ස්ටැලින්වාදීන් ක්ෂමා විරහිත ලෙස අයෝජක-හිතැති

පිලිවෙත් ක්‍රියාවට දැමීම, බටහිර බෙංගාලයේ දුගී ගොවීන්ගේ ප්‍රකාශිකාවක ලෙස ද ටාටාලා ඉදිරියේ ආන්ඩුවේ නියාලු පිලිවෙතේ විරුද්ධවාදිනියක ලෙස ද තමන්ව නරුම ලෙස වාත්තු කර ගැනීමේ හැකියාව ඇයට ලබා දී තිබේ.

සින්ගුර් උද්ඝෝෂනය තුල ඇගේ ක්‍රියාකලාපය ටාටා විසින් හෙලාදකිනු ලැබීමට බැනර්ජි තදබල ලෙස ප්‍රතිචාර දැක්වූයේ, සමාගම සින්ගුර්වලින් ඉවත් වීම සිය පක්ෂය අපකීර්තියට ලක් කිරීමේ එල්ලයෙන් යුක්ත ටාටා-සීපීඑම් ඒකාබද්ධ උපාමාරුවක් යයි පවසමිනිඃ "ආන්ඩුව තමන්ගේ අද්වකාත් ලෙස ක්‍රියා කරන ලෙස ටාටාබාබු කැඳවා තිබේ. ව්‍යාපෘතිය සඳහා ආන්ඩුව හා ටාටාලා අතර අත්සන් කරපු ගිවිසුමේ විස්තර කාටවත් දැන ගන්න බැරි ඇයි? ඇයි ටාටා අපට අවලාද නගන්න ප්‍රවෘත්ති සාකච්ඡාවක් තිබ්බෙ? ඒක ඒකාබද්ධ දේශපාලන උපාමාරුවක් නිසා."

මමතා බැනර්ජි වැනි දක්ෂිනාංශික වාචාලියකට ගොවි ජනතාවගේ යුක්තියුක්ත දුක්ගැනිවිලි ගසාකා ඒවා තමන්ගේ වාසියට යොදා ගෙන සිය දක්ෂිනාංශික න්‍යාය පත්‍රයට ඒවා ගැට ගසා ගැනීමේ හැකි වන කොන්දේසි නිර්මානය කිරීම සම්බන්ධයෙන් මූලික වගකීම පැවරෙන්නේ සීපීඑම් හා එහි වාම පෙරමුනු හවුල්කරුවන් මත ය. එහෙත් සීපීඑම් හා ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය වෙතින් කැඩී ගිය විවිධාකාර "වාම" කන්ඩායම් ද වැදගත් ද්විතියික ක්‍රියාකලාපයක් ඉටු කර තිබේ.

සින්ගුර් විරෝධතා ව්‍යාපාර සිය පාලනයට ගැනීමේ හැකියාව බැනර්ජිට ලැබුනේ, ඉන්දියාවේ සමාජවාදී එකමුතු කෙන්ද්‍රය (සුසී) මාක්ස්වාදී-ලෙනින්වාදී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි-එම්එල්) සහ සෙසු නැක්සලයිට් (මාඕවාදී) කන්ඩායම් වෙතින් ඇයට ලැබුනු සහයෝගය නිසා ම පමනි. බැනර්ජි අඩු තපුර බවට සහ/හෝ සීපීඑම් "සමාජ ෆැසිස්ට්වාදීන්" බවත් නියම ස්ටැලින්වාදී ශෛලියෙන් තර්ක කරමින්, ඔවුහු, ටීඑම්සීයේ ප්‍රතිගාමී දේශපාලනයට ගොවියන්ගේ අරගලය ගැට ගසනු වස් තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කලහ.

## කොංග්‍රස් පක්ෂය සහ මහ ව්‍යාපාරිකයෝ

ඉන්දියාවේ යූපීඒ ආන්ඩුවේ නායක හවුල්කරු වන කොංග්‍රස් පක්ෂය, ආරම්භයේ දී, සින්ගුර් උද්ඝෝෂනය සම්බන්ධයෙන් බැනර්ජිට ධෛර්‍යය සැපයීය. ඒ, ප්‍රතිගාමී ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම ක්‍රියාවට දැමීමට පසුගිය ජූලි මස කොංග්‍රසය තීන්දු කිරීමෙන් පසුව වාම පෙරමුන යූපීඒ ආන්ඩුවට දුන් සිය පාර්ලිමේන්තු සහයෝගය ඉවත් කර ගැනීමට ගත් තීන්දුව සම්බන්ධයෙන් පලිගැනීමක් වසයෙනි.

එහෙත් තමන් බටහිර බෙංගාලයෙන් ඉවත් වන බවට ටාටා මෝටර්ස් සමාගම නිවේදනය කිරීමට කෙටි කලකට පෙර, කොංග්‍රස් පක්ෂ නායකත්වය මාවත වෙනස් කොට සින්ගුර් සම්බන්ධයෙන් පවතින ටීඑම්සී-වාම පෙරමුනු මතභේදය අවසන් කිරීමේ අතරමැදියකු ලෙස ක්‍රියා කිරීමට තමන් කැමති බවට සංඥා කලේ ය.

මෙය හුදෙක්, ඉන්දියාවේ වැදගත් ම අන්තර්ජාතික සමාගමක් වන ටාටා වෙනුවෙන් මැදිහත් වීම පිලිබඳ ප්‍රශ්නයක් නොවීය.

ලබන මැයි මස වන විට පැවැත්විය යුතු ඊලග ජාතික මැතිවරනයෙන් පසුව තමන්ට වාම පෙරමුනේ පාර්ලිමේන්තු සහයෝගය බොහෝ විට අවශ්‍ය විය හැකි යයි කොංග්‍රස් පක්ෂ නායකත්වය ගනන් බලයි.

අගමැති මන්මෝහන් සිං සහ කොංග්‍රස් පක්ෂ සභාපතිනි සෝනියා ගාන්ධි, ඉන්දියානු දේශපාලනයට ඔවුන් කල ඇති ප්‍රතිපදානය වෙනුවෙන් සීපීඑම් හා වාම පෙරමුන නැවත නැවතත් ප්‍රශංසාවට ලක් කර තිබේ. මෙය ප්‍රථම ද ප්‍රමුඛ ද වන්නේ, කම්කරු පන්තිය දේශපාලනිකව දුර්වල කිරීමෙහි ලා ස්ටැලින්වාදින් ඉටු කරන තීරනාත්මක ක්‍රියාකලාපය ඔවුන් අවබෝධ කර ගෙන ඇති නිසා ය. එහෙත්, ඔවුහු හවුල්කරුවකු ලෙස වාම පෙරමුනට වඩා කැමැත්තක් ද දක්වති. ඒ මක් නිසා ද කියතොත්, ඔවුන්ගේ දෘෂ්ටි ආස්ථානයෙන් ගත් කල, පසුගිය සියවස් කාර්තුවක කාලය තිස්සේ ඉස්මතු වී ඇති ප්‍රාදේශීය හා කුල පදනමකින් යුක්ත ධනේශ්වර පක්ෂ බොහොමයකට වඩා, වාම පෙරමුන, ඉන්දියාවේ "ජාතික අවශ්‍යතාවන්ට", එනම් පාලක ප්‍රභූවේ වඩාත් ම බලගතු කොටස්වල අවශ්‍යතාවන්ට, යටත් වීමට බෙහෙවින් සූදානම් නිසා ය.

අවසානයේ දී, කොංග්‍රසය මැදිහත්කරුවකු වීමේ යෝජනාව, ටාටා සමාගම හෝ බටහිර බෙංගාල ආන්ඩුව විසින් භාර ගනු පිනිස පමනට වඩා කොන්දේසි සහිත හා පමනට වඩා ප්‍රමාද වී කෙරුනු එකක් විය.

ඉන්දියානු මහා ව්‍යාපාරිකයන් ටීඑම්සී නායකත්වයෙන් යුක්ත සින්ගුර් උද්ඝෝෂනය දෙස බැලුවේ ප්‍රවේශම් සහගතව ය. කොංග්‍රසය මෙන් ම, ඔවුහු ද බටහිර බෙංගාල ආන්ඩුව තව දුරටත් දකුනට තල්ලු කරනු පිනිස, සින්ගුර් උද්ඝෝෂනයත් නන්දිග්‍රාම්හි ස්ටැලින්වාදීන්ගේ මැර ක්‍රියාවන් මගින් අවුලුවන ලද දේශපාලන අර්බුදයත් යොදා ගැනීමට සූදානම් වූහ. එමෙන් ම, සින්ගුර් උද්ඝෝෂනය, ජාත්‍යන්තර ආයෝජකයන්ගේ පසුබෑමට ද ඉන්දියාවේ සෙසු ප්‍රදේශවල විශේෂ ආර්ථික කලාප සඳහා සිය ඉඩම් පවරා ගැනීමට එරෙහිව ගොවි ජනතාව දක්වන ප්‍රතිරෝධය ශක්තිමත් කිරීමට ද හේතු වනු ඇතැයි ඔවුහු උත්සුක වූහ.

මේ සම්බන්ධයෙන් ගත් කල, දක්ෂිනාංශික ඉන්දියන් එක්ස්ප්‍රස් පත්‍රය ටාටා සමාගම සින්ගූර්වලින් ඉවත් වීමට දැක්වූ ප්‍රතිචාරය අර්ථභාරී ය. මමතා බැනර්ජිව හෙලා දකින අතර ම, එය, කෙසේ වෙතත්, ටාටා ඉවත් වීම පිලිබඳව ස්ටැලින්වාදීන් ද ආංශිකව වගකිව යුතු යයි අදහස් කලේ, ස්ටැලින්වාදීන් අතීතයේ දී මෙහෙය වූ සීමිත වෘත්තීය සමිති අරගල සහ ඉඩම් හිමියන්ට එරෙහි විරෝධතා බටහිර බෙංගාලය තුල මහජන විරෝධතා සංස්කෘතියක නැග්මට තුඩු දී ඇති බව කියාපාමිනි.

“දෝෂාරෝපනය පාර්ශ්වයන් ගනනාවකට යාමට තරම් ප්‍රමානවත් යි” යනුවෙන් ඉන්දියන් එක්ස්ප්‍රස් පැවසී ය. “එයින් කොටසක් නොවැලැක්විය හැකි ලෙස ම යන්නේ, . . . රටන් ටාටා පලවා හැරිය වර්ගයේ උද්ඝෝෂනවලට අවකාශයක් විවෘත කලා වූ ද ඒවාට ඒවායේ විධික්‍රම ලබා දුන්නා වූ ද වාම පෙරමුන වෙත ය. ටාටා වේදනාවෙන් යුක්තව පෙන්වා දුන් පරිදි, එයින් බොහෝ කොටසක් යා යුත්තේ, එම විධික්‍රම වර්තමානයේ යොදා ගන්නා අයට ය -- මමතා බැනර්ජිට හා ඇය නායකත්වය දෙන බවට අඟවන, කිසිවක් නොදන්නා යහපත් අභිප්‍රායන්ගෙන් යුක්ත එහෙත් ප්‍රායෝගික නොවන පුද්ගලයන්ගෙන් සමන්විත අච්චාරු සන්ධානය වෙත ය.

සීපීඑම් නායකත්වය සහ විශේෂයෙන් ම මහ ඇමති භට්ටාචාර්ජී, ඉන්දියන් එක්ස්ප්‍රස් එතරම් ම හඬා වැලපෙන අතීතයෙන් දුරස්ථ වී ගැනීමේ මංමුලා සහගත උත්සාහයක යෙදී සිටින බව, මෙහි දී එකතු කල යුතු ය. 2005 දී සීපීඑම් විසින් සහයෝගය දෙන ලද එක් දින මහා වැඩ වර්ජනයක් බටහිර බෙංගාලයේ තොරතුරු තාක්ෂන හා එයට සම්බන්ධිත සෙසු කර්මාන්තවල වැඩ කටයුතු කඩාකප්පල් කර බැවින් එම වර්ජනය හෙලා දුටු භට්ටාචාර්ජී, දැන් තමන් වාම පෙරමුන හා එයට අනුබද්ධිත සමිති විසින් කැඳවනු ලබන මොන යම් හෝ අනාගත හර්තාලයකට, එනම් දේශපාලන වර්ජනයකට, ප්‍රසිද්ධියේ විරුද්ධ වන බවට පොරොන්දු වී තිබේ.

සින්ගූර් උද්ඝෝෂනයේ ප්‍රතිඵල අවධාරනය කරන්නේ, කම්කරු පන්තිය වාම පෙරමුනෙන් දේශපාලනිකව බිඳී ඉන්දියාවේ වැඩ කරන ජනතාව මුහුන දෙන සමාජ අර්බුදය විසඳලීමේ තමන්ගේ ම ක්‍රියාමාර්ගය -- කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා අරගලය -- ඉදිරිපත් කිරීමේ හදිසි භාවය යි. එවන් ව්‍යාපාරයක්, ලෝක ආර්ථිකයේ සම්පත් වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර පාලනය යටතේ තබා දුප්පත්කම හා ආර්ථික අනාරක්ෂිත භාවය තුරන් කිරීම පිනිස ඒවා යොදා ගැනීමට හැකි වන පරිදි, ජාත්‍යන්තර කම්කරු පන්තිය සමග සන්ධානගතව, ධනවාදය අවසන් කිරීමට සටන් වදිනු ඇත.

© www.wsws.org